# බළන්ගොඩ නගර සභාව
## 2022-06-01 වන දිනැති විශේෂ මහා සභා රැස්වීම් වාර්තාව

**ස්ථානය - බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**

**දිනය - 2022.06.01**

**වේලාව - පෙ.ව. 10.00**

**බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති ඩබ්.ඒ. වසන්ත ගුණරත්න මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙදින විශේෂ මහ සභාවේ කටයුතු පවත්වන ලදී.**

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ගරු සභාපති | ඩබ්.ඒ.වසන්ත ගුණරත්න මැතිතුමා |
| 2. ගරු උප සභාපති | එම්.ටී.එම්.රුමී මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | ලාල් ගලප්පත්ති මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රී | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රී | එම්.ඩබ්.විමලසිරි මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රිනී | ජී. චන්ද්‍රලතා මැතිතුමිය |
| 8. ගරු නාගරික මන්ත්‍රිනී | සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය |
| 9. ගරු නාගරික මන්ත්‍රිනී | අයි.ඒ.එම්. ඉලංකෝන් මැතිතුමිය |

**නිළධාරි සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ලේකම් | ඩී.එම්.ජේ.යූ.ධර්මරත්න මයා |

ගරු සභාපතිතුමන් විසින් මෙදින විශේෂ මහ සභාව සඳහා සහභාගි වූ ගරු උප සභාපතිතුමා, ගරු නාගරික මන්ත්‍රීවරුන් ඇතුළු සියළුම දෙනා පිළිගනිමින් ආගම සිහි කිරීමෙන් අනතුරුව ගරු සභාවේ වැඩ කටයුතු ආරම්භ කළ අතර, විශේෂ යෝජනා කිහිපයක් වෙනුවෙන් සභා අනුමැතිය ලබා ගැනීම සඳහා මෙදින විශේෂ මහ සභාව පවත්වන බව පවසන ලදී.

1. තුඹගොඩ, කජු කඩය පිටුපස සාංඝික මහා සුදර්මාරාම විහාරස්ථානයේ භූමිය හරහා වැටී ඇති අප ජලය බැහැරලීමේ නගර සභාවට අයත් කාණුවේ ඉතිරි 20% ක ප්‍රමාණය නව මිල ගණන් යටතේ සංවර්ධනය කිරීම හා එම කර්මාන්තය සිදු කිරීමට තුඹගොඩ සුහසරණ ජ්‍යෙෂ්ඨ පුරවැසි සමිතිය වෙත ලබා දීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම (ඇස්තමේන්තුගත මුදල 1,316,426.07)

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් මෙම කාණුව බුලත්ගම එක්සත් මිතුරු සංසදය විසින් 2,960,000.00 ක ඇස්තමේන්තු මුදලක් යටතේ 2022-02-28 දින ගිවිසුම්ගතව සිදු කළ අතර, 2022-05-05 වන දින 80%ක වැඩ නිම කිරීමෙන් පසුව කොටස් වශයෙන් ගෙවීම් කර ඇති බව ද පවතින මිල ඉහළ යාම හමුවේ ඉතිරි කොටස එම ගිවිසුම්ගත මිල යටතේ ඉටු කළ නොහැකි බව 2022-04-28 දිනැති ලිපිය මඟින් දන්වා ඇති අතර, 2022-04-29 දිනැතිව තමාගේ තීරණය මත එම ගිවිසුම අවලංගු කළ බවද පවසන ලදී.

එමෙන්ම 2022/03 දරණ ජාතික අයවැය චක්‍රලේඛයේ 03 (iii) අංකය දරණ වගන්තියෙහි, "අර්ධව සම්පූර්ණ කරන ලද යටිතල පහසුකම් ව්‍යාපෘති අත්හිටුවීමේ දී එම යටිතල පහසුකම් භාවිතා කරන ජනතාවට වන අපහසුතා අවම වන පරිදි හා ඒවායේ දිගුකාලීන පැවැත්ම තහවුරු වන පරිදි අවශ්‍යම කොටස් නිම කිරීම කළ යුතුය." යනුවෙන් සඳහන් කර ඇති බැවින් ඒ යටතේ මහජන සුභ සිද්ධිය උදෙසා මෙන්ම සමස්ථ ව්‍යාපෘතිය ඵලදායී වීම පිණිස කාණුවේ ඉතිරි 20% ක කොටස ඉදි කිරීම අත්‍යවශ්‍ය වන බව කාර්මික නිළධාරී විසින් ලිඛිතව තහවුරු කර ඇති බව ද ඒ අනුව මෙම කර්මාන්තයේ ඉතිරි 20%ක කොටස නව මිල ගණන් යටතේ සංවර්ධනය කිරීම හා එම කර්මාන්තය සිදු කිරීමට තුඹගොඩ සුහසරණ ජ්‍යෙෂ්ඨ පුරවැසි සමිතිය වෙත ලබා දීම සුදුසු බව ද ගරු සභාපතිතුමන් පැවසීය.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

2. හුණුකුඹුර දෙල්ගස්වත්ත මාර්ගයේ සෙල්වකුමාර මහතාගේ නිවස පිටුපස ඇති පැති බැම්මේ මුල් කොටස වැඩ නිම කර ඇති අතර, ඉතිරි කොටසේ වැඩ නිම කිරීම හා එම කර්මාන්තය සිදු කිරීමට තුඹගොඩ සුහසරණ ජ්‍යෙෂ්ඨ පුරවැසි සමිතිය වෙත ලබා දීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම (ඇස්තමේන්තුගත මුදල රු. 340,000.00)

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී මංගලිකා ඉලංකෝන් මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මේ සම්බන්ධව අදහස් දක්වූ ගරු සභාපතිතුමා, 2022/03 දරණ ජාතික අයවැය චක්‍රලේඛයේ 03 (iii) අංකය දරණ වගන්තියෙහි, "අර්ධව සම්පූර්ණ කරන ලද යටිතල පහසුකම් ව්‍යාපෘති

අත්හිටුවීමේ දී එම යටිතල පහසුකම් භාවිතා කරන ජනතාවට වන අපහසුතා අවම වන පරිදි හා ඒවායේ දිගුකාලීන පැවැත්ම තහවුරු වන පරිදි අවශ්‍යම කොටස් නිම කිරීම කළ යුතුය." යනුවෙන් සඳහන් කර ඇති බව ද මහජන සුභ සිද්ධිය උදෙසා මෙන්ම සමස්ථ ව්‍යාපෘතිය ඵලදායී වීම පිණිස මෙම කර්මාන්තයේ ඉතිරි කොටස ඉදි කිරීම අත්‍යවශ්‍ය වන බව කාර්මික නිළධාරී විසින් ලිඛිතව තහවුරු කර ඇති බව ද මේ සඳහා අදාල කොට්ඨාසයේ ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය විසින් ඉල්ලීමක් කර ඇති බව ද ඒ අනුව මෙම කර්මාන්තයේ ඉතිරි කොටස නව මිල ගණන් යටතේ සංවර්ධනය කිරීම හා එම කර්මාන්තය සිදු කිරීමට තුඹගොඩ සුහසරණ ජ්‍යෝෂ්ඨ පුරවැසි සමිතිය වෙත ලබා දීම සුදුසු බව ද ඒ සඳහා ඇස්තමේන්තුගත මුදල රු. 340,000.00ක් වන බව ද පවසන ලදී.

මෙහි දී අදහස් දැක් වූ ගරු උප සභාපති එම්.ටී.එම්. රූමි මැතිතුමා, මන්ත්‍රී යෝජනා සඳහා වෙන් වූ රුපියල් ලක්ෂ 10 ක මුදලින් තම කොට්ඨාසයේ පැති බැම්මක කොටසක් නිම කළ නමුත් ඉතිරි කොටසෙහි වැඩ නිම කිරීමට නොහැකි වුවහොත් එම කර්මාන්තය සම්පූර්ණ නොවන බව ද ඇස්තමේන්තු සකස් කර ඇති බව ද මෙම යෝජනාවත් තමන්ගේ යෝජනාවට සමානම යෝජනාවක් බැවින් තම කර්මාන්තයේ ඉතිරි කොටස සිදු කිරීම සඳහා ද අනුමැතිය ලබා දෙන ලෙස ද මේ සම්බන්ධව අදාල නිළධාරීන්ගෙන් පැහැදිලි කර ගැනීමක් අවශ්‍ය බව ද පවසන ලදී.

මේ සම්බන්ධව ලේකම්තුමාගෙන් සහ ගණකාධිකාරීතුමාගෙන් කරුණු පැහැදිලි කර ගැනීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් හා ගරු උප සභාපති එම්.ටී.එම්. රූමි මැතිතුමාගේ ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත් කරන ලදි.

2022-04-06 දිනැතිව මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 සම්බන්ධව හා පළාත් පාලන කොමසාරිස්ගේ CLG/AD/1/8/1 හා 2022-05-25 දිනැති ලිපිය සම්බන්ධව මෙන්ම අදාල අනිකුත් කරුණු පැහැදිලි කරගැනීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් හා ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත්කර ගන්නා ලදි.

ඒ අනුව 2022/03 දරණ ජාතික අයවැය චක්‍රලේඛයේ 03 (iii) අංකය දරණ වගන්තියෙහි, "අර්ධව සම්පූර්ණ කරන ලද යටිතල පහසුකම් ව්‍යාපෘති අත්හිටුවීමේ දී එම යටිතල පහසුකම් භාවිතා කරන ජනතාවට වන අපහසුතා අවම වන පරිදි හා ඒවායේ දිගුකාලීන පැවැත්ම තහවුරු වන පරිදි අවශ්‍යම කොටස් නිම කිරීම කළ යුතුය." යනුවෙන් සඳහන්ව ඇති බැවින් ඒ යටතේ මෙම කර්මාන්තය ඉටු කළ හැකි බව ද මේ යටතේ ඉටු කළ හැකි සියලුම සංවර්ධන යෝජනා ලබා දෙන ලෙසද 2022 අයවැය මඟින් මූලධන ව්‍යාපෘති වෙනුවෙන් මන්ත්‍රීවරුන් වෙත වෙන් කර ඇති රුපියල් ලක්ෂ 10 ක මුදලෙන් දැනට එක් එක් මන්ත්‍රීවරුන් වෙත ඉතිරිව ඇති මුදලින් නව මූලධන ව්‍යාපෘති ඉටු කිරීම පිළිබඳව ද 2022/03 මුදල් චක්‍රලේඛය ප්‍රකාරව නව මූලධන ව්‍යාපෘති සිදු කිරීමට නොහැකි බැවින් ද සභාවේ එවක පැවති තත්ත්වය අනුව වසර 04 ක් පුරා ගරු මන්ත්‍රීවරුන්ට මහජනතාව වෙනුවෙන් අවශ්‍ය සේවය සැලසීම කල නොහැකි වූ බැවින් ද 2022/03 මුදල් චක්‍රලේඛය හා පළාත් පාලන කොමසාරිස්ගේ CLG/AD/1/8/1 හා 2022-05-25

දිනැති ලිපිය මත පිහිටා කටයුතු කිරීමෙන් එම වැඩ කටයුතු ඉටු කළ නොහැකි බැවින් ද ඒ සම්බන්ධව ගරු ආණ්ඩුකාරතුමා සමඟ සාකච්ඡා කළ යුතු බව ගරු සභාපතිතුමා පවසන ලදී.

එමෙන්ම 2022/03 මුදල් චක්‍රලේඛය මන්ත්‍රීවරුන් සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදනවලින් ඉටු කිරීමට නියමිත මූලධන ව්‍යාපෘති සඳහා අදාල කර නොගැනීම පිණිස ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට ඉදිරිපත් කර විශේෂ අවසරය ලබා ගැනීමට ද මේ සම්බන්ධව සියලුම මන්ත්‍රීවරුන් හා නිලධාරීන් ගරු ආණ්ඩුකාරතුමා සමඟ සිදු කරන සාකච්ඡාවක් මඟින් හා එක් එක් ව්‍යාපෘතියේ අවශ්‍යතාවය හා ප්‍රතිපාදන බළන්ගොඩ නගර සභාව විසින් දැරීම යන පදනම මත පිහිටා එම විශේෂ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන බවද ඒ සඳහා එක් එක් මන්ත්‍රීවරුන් සඳහා වෙන් වූ ඉතිරි ප්‍රතිපාදන මුදලින් ඉටු කර ගත යුතු යෝජනා කඩිනමින් තමා වෙත ඉදිරිපත් කරන ලෙස ද වැඩිදුරටත් ගරු සභාපතිතුමා පවසන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

3. සෘජු කම්කරු දෛනික ගෙවීම් හා සභාව සතු යන්ත්‍ර සූත්‍ර හා වාහන කුලියට දීමේ ගාස්තු සංශෝධනය කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

රත්නපුර දිස්ත්‍රික් සැපයුම් හා සේවා මිල නියම කිරීමේ 2022 අප්‍රේල් කමිටු වාර්තාව අනුව,

| | පවතින මිල ගණන් (රු.) | සංශෝධිත මිල ගණන් 2022 මිල නියම කිරීමේ කමිටු වාර්තාව අනුව (රු.) |
|---|---|---|
| නුපුහුණු කම්කරුවෙකු සඳහා | 1,350.00 | 1,600.00 |
| අර්ධ පුහුණු කම්කරුවෙකු සඳහා | 1,500.00 | 1,800.00 |
| පුහුණු කම්කරුවෙකු සඳහා | 1,950.00 | 2,300.00 |

ක් වශයෙන් 2022 මැයි මස සිට ක්‍රියාත්මක වන පරිදි සෘජු කම්කරු දෛනික ගෙවීම් සිදු කිරීම සුදුසු බව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය ස්ථිර කරන ලදී.

එමෙන්ම බළන්ගොඩ නගර සභාවේ අංශ ප්‍රධාන කමිටුවේ දී තීරණය කර ගත් පරිදි සභාවට අලාභයක් සිදු නොවන ලෙස සේවා පවත්වා ගෙන යාමේ අරමුණින් පවතින වෙළඳපොල තත්ත්වයන් යටතේ පහත පරිදි මිල ගණන් සංශෝධනය කළ අතර, ඒ අනුව

| **සේවාව** | **පවතින මිල** | **2022-05-24 සිට යෝජිත මිල** |
|---|---|---|
| ජල බවුසරය කුලියට ලබා දීම<br>• පානීය ජල බවුසරයක්<br>• පානීය නොවන ජල බවුසරයක්<br>• ස්ථනයේ නතර කර තැබීම දිනකට<br>• සංවර්ධන කටයුතු වලදී ජලය ඉසීම හෝ අමතර ජල බවුසරයකට<br>• නගර සභා සීමාවෙන් පිට වැඩිවන සෑම කිලෝමීටරයකටම රු.350.00 (Up and Down එකතුව) ලෙස අයකිරීම | <br>රු.5,000.00<br>රු.4,500.00<br>රු.4,000.00<br>රු.2,000.00<br>රු. 300.00 | <br>රු.6,000.00<br>රු.5,300.00<br>රු.4,000.00<br>රු.2,500.00<br>රු. 350.00 |
| JCB යන්ත්‍රය කුලියට ලබා දීම (යන්ත්‍ර පැයකට ක්‍රියාකරු සමඟ) | රු.5,000.00 | රු.6,000.00 |
| ලෙලෙන තලනය කුලියට ලබා දීම<br>• ටොන් 01 පැය 08ක සේවා දින 01 ක්<br>• දින භාගයක් සඳහා<br>• ටොන් 10 යන්ත්‍ර පැය 01ක් සඳහා ක්‍රියාකරු හා ඉන්ධන සමඟ (පැය 01 ක් සඳහා) | <br>රු.4,500.00<br><br>රු.5,200.00 | <br>රු.5,000.00<br>රු.3,500.00<br>රු.5,900.00 |
| මෝටර් ග්‍රේඩරය කුලියට ලබා දීම (පැයකට රියදුරු හා ඉන්ධන සමඟ) | රු.5,500.00 | රු.6,500.00 |
| ගලි සේවාව (ලීටර 2500)<br>• නගර සීමාවේ නිවාස/ ආගමික ස්ථාන/පුණ්‍ය ස්ථාන/පාසල් හා රජයේ ස්ථාන<br>• නගර සීමාවේ ව්‍යාපාරික ස්ථාන සඳහා<br>• නගර සීමාවෙන් පිටත නිවාස/ ආගමික ස්ථාන/පුණ්‍ය ස්ථාන/පාසල් හා රජයේ ස්ථාන<br>• නගර සීමාවෙන් පිටත ව්‍යාපාරික ස්ථාන සඳහා<br>• නගර සීමාවෙන් පිටත වැඩිවන සෑම කිලෝ මීටර් එකක් සඳහා(Up and Down එකතුව ලෙස අයකිරීම)<br>• ලීටර් 4000 ගලි බවුසරය<br>• නගර සීමාවෙන් පිටත වැඩිවන සෑම කිලෝ මීටර් එකක් සඳහා(Up and Down එකතුව ලෙස අයකිරීම) | <br>රු.7,500.00<br>රු.8,500.00<br>රු.10,000.00<br>රු.11,500.00<br>රු. 300.00<br>රු.14,000.00<br>රු. 400.00 | <br>රු.8,500.00<br>රු.10,000.00<br>රු.11,000.00<br>රු.13,000.00<br>රු. 350.00<br>රු.16,500.00<br>රු. 450.00 |

2022-05-24 දින සිට ක්‍රියාත්මක වන පරිදි අදාල සේවාවන් නව මිල ගණන් යටතේ ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**4.** තුඹගොඩ ශ්‍රී සාංඝික මහා සුධර්මාරාම විහාරස්ථානයේ අනුශාසනා පරිදි බළන්ගොඩ එක්සත් බෞද්ධ සංගමය මඟින් මෙහෙයවන මිහිඳු මහ පෙරහැර වෙනුවෙන් මූල්‍යමය දායකත්වයක් ලබා දීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් මූල්‍ය දායකත්වය වශයෙන් මුදලක් ලබා දිය යුතු බව ද ඊට අමතරව මාර්ගය සුද්ධ කර ගැනීම ආදී වෙනත් කාර්යයන් කිහිපයක් ඉටු කර දෙන ලෙස ඉල්ලීම් කර ඇති බැවින් එම කටයුතු සිදු කළ යුතු බව ද පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පැවසුවේ පෙර වර්ෂයෙහි පැවැති මිහිඳු පෙරහැර සඳහා ලක්ෂ 16 ක් පමණ වැය වී ඇති නමුත් පවතින ආර්ථික අර්බුදය හමුවේ රුපියල් ලක්ෂ 07 ක මුදලින් මෙවර පෙරහැර පැවැත්වීමට සූදානම්ව ඇති බව ද එම ලක්ෂ 07 ක මුදල සොයා ගැනීමට පවා දුෂ්කර වී ඇති බව ද පැවසීය.

ඒ අනුව මිහිඳු මහා පෙරහැර වෙනුවෙන් රුපියල් ලක්ෂ දෙකක මුදලක් ලබා දීම සුදුසු බවට ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්. රූමි මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**5. බළන්ගොඩ බස් නැවතුම්පොළ පොදු වැසිකිළි සහ මහජන පොළ පොදු වැසිකිළි නඩත්තු කටයුතු සහ පිරිසිදු කිරීමේ ටෙන්ඩරය අවලංගු නොකිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම**

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් බළන්ගොඩ බස්නැවතුම්පොළ පොදු වැසිකිළි සහ මහජන පොළ පොදු වැසිකිළි නඩත්තු කටයුතු සහ පිරිසිදු කිරීමේ ටෙන්ඩරයේ ගිවිසුම් කඩ කර ඇති බැවින් නැවත සභාවට පවරාගෙන ටෙන්ඩර් කරන තුරු සභාවෙන් අදාල නඩත්තු හා පිරිසිදු කිරීමේ කටයුතු සිදු කිරීම 2022-05-19 දිනැති මහ සභාවේ 05:01:17 යටතේ සභා සම්මත වූ

නමුත් අදාල ටෙන්ඩර්කරු විසින් ගිවිසුම් ප්‍රකාරව ඉදිරියේ දී කටයුතු කරන බවත්, කිසිඳු චෝදනාවකින් තොරව අවශ්‍ය කටයුතු සිදු කරන බවටත්, හිඟ මුදල් සියල්ල සභාව වෙත ගෙවන බවටත් පොරොන්දු වෙමින් ටෙන්ඩර් කාලය අවසන් වනතුරු අදාල ටෙන්ඩරය ලබා දෙන ලෙස ලිඛිත ඉල්ලීමක් කර ඇති බව පැවසීය.

ඒ අනුව අදාල නඩත්තු හා පිරිසිදු කිරීමේ කටයුතු සභාවෙන් සිදු කිරීමේදී අවශ්‍ය ප්‍රමාණවත් සේවක පිරිසක් නොමැති වීම හා සභාවට නිශ්චිත ආදායමක් ලබා ගැනීමට ඇති දුෂ්කරතාවය යන කරුණු සැලකිල්ලට ගෙන 2022-05-19 දිනැති මහ සභාවේ 05:01:17 යටතේ යටතේ සම්මත වූ යෝජනාව අවලංගු කිරීමටත්, ටෙන්ඩර් කාලය අවසන් වන තුරු බී. විනෝදනී ප්‍රේමිකා යන අය වෙතම බළන්ගොඩ බස්නැවතුම්පොළ පොදු වැසිකිළි සහ මහජන පොළ පොදු වැසිකිළි නඩත්තු කටයුතු සහ පිරිසිදු කිරීමේ ටෙන්ඩරය ලබා දීම සුදුසු බවටත් ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්. රූමි මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

අනතුරුව අද දින ගරු සභාව සාර්ථකව පවත්වා ගැනීමට සහයෝගය ලබාදුන් ගරු උප සභාපතිතුමා ඇතුළු නාගරික මන්ත්‍රී මණ්ඩලය හා කාර්ය මණ්ඩලය සඳහා ස්තුතිය පුදකරමින් පෙ.ව 10.55 ට පමණ විශේෂ මහ සභාවේ කටයුතු අවසන් කරන ලදි.

ඩබ්.ඒ.වසන්ත ගුණරත්න,
සභාපති,
බළන්ගොඩ නගර සභාව